පිට්ටනිය

ශ්‍රී ලංකා ක්‍රිකට් පිල බටහිර ඉන්දීය කොදෙව්වන්ට එරෙහිව කැපී පෙනෙන ටෙස්ට් ජයග්‍රහණයක් ලබාගත්තේ 2-0 ක් ලෙසිනි. එහෙත්, මෙම ජයග්‍රහණය ගැන කතාකෙන්න දුරට උදම් ඇතිය හැකි දියි යන්න බරපතල ප්‍රශ්නයකි. මන්ද යත් ලිපිපුටවන් බදු වූ දුර්වල කොදෙව් පිල හමුවේත් ශ්‍රී ලංකාව තම ජයග්‍රහණය ලැබුවේ ක්‍රීඩකයන් කිහිප දෙනෙකුගේ පෞද්ගලික දක්ෂම මත වීම නිසා ය.

එස්.එස්.සී ක්‍රීඩාංගණයේ පැවැති පළමු ටෙස්ට් තරගයේ දී ශ්‍රී ලංකාව ජය ගත්ත ද පළමු ඉනිමේ දී ඉදිරියෙන් සිටින්නට බටහිර ඉන්දීය කොදෙව්වෝ සමත් වූහ. අස්ගිරියේ පැවැති දෙවන ටෙස්ට් තරගයේ දී ද ශ්‍රී ලංකාව මුල් ඉනිමේ දී ඉදිරියෙන් සිටියේ, ලකුණු දෙකකින් පමණි. තරග දෙකේ ම සමස්ත ප්‍රතිඵලය ජයග්‍රහණයක් වීම නිසා, මේ කතාබහ වැදගත් නොවේ යැයි ඇතැම් ක්‍රීඩා පණ්ඩිතයන් පැවසිය හැකි ය. එහෙත්, ලාරා, ජේවාන්, ක්‍රිස්ලේල්, කොලින්ස් වැනි අත්දැකීම් බහුල ක්‍රීඩකයන් නොමැති කොදෙව් පිලක් හමුවේ ශ්‍රී ලංකා පිල කණ්ඩායමක් ලෙස දක්වූ දක්ෂම ප්‍රමාණවත් ද යන්න ප්‍රශ්නකාරී ය.

පළමු තරගයේ පළමු ඉනිමේ දී ශ්‍රී ලංකා පන්දු ය වන්නෝ සාර්ථක වූව ද පිතිකරුවෝ සියල්ලන් ම පාහේ අසාර්ථක වූහ. පිත්තෙන් දක්ෂම දක්වන්නට සිදුවේ ද මුලදිට හා වාස්ට ය. පන්දුව අතර ගත් මුවුනු තරග දෙකේ දී ම තම සුපුරුදු දක්ෂම පෑහ. දෙවන දෙවන ඉනිමේ දී සංගක්කාර තරගාවලියේ වාර්තා වූ එක ම ශතකය රැස් කළේ ය. සමස්තයක් ලෙස ගත් කළ මෙම තරගාවලියේ දී ශ්‍රී ලංකා පිල වෙනුවෙන් තම යුතුකම් කොටස ඉටු කළේ මුරලි, වාස් හා සංගක්කාර යන ක්‍රීඩකයන් පමණි. සෙසු සියලු ම ක්‍රීඩකයෝ සිය සුපුරුදු ක්‍රීඩා රටාවට අවතීරණ නොවූහ. විශේෂයෙන් මාවන්, සනත්, මහේල, යන පිතිකරුවෝ අසාර්ථක වූහ. රංගන හේරත් ද අසාර්ථක පන්දු යවන්නෙක් විය. ටෙස්ට් කණ්ඩායමට අලුතෙන් හඳුන්වා දුන් ගයාන් විජේකෝන් ද බලපොරොත්තු වූ දක්ෂම දක්වූවේ නැත. ක්‍රිකට් ක්‍රීඩාවේ දී සැමදා උපරිම දක්ෂම දක්වීමට නොහැකි ය. එහෙත්, ඉතිම් හතරකින් එක් ඉනිමක දී වත් දක්ෂම දක්වීමට නොහැකි නම් එය ලළි යළිත් ප්‍රශ්න කළ යුතු තත්වයකි.

ශ්‍රී ලංකාවේ අනාගත ක්‍රිකට් ක්‍රීඩාව දෙසට මෙහි දී අනිවාර්යයෙන් ම යොමු විය යුතු ය. සනත් ජයසූරියට උපරිම වශයෙන් තව ක්‍රීඩා කළ හැක්කේ වසර දෙකක් පමණි. මෙය ද ඔහුගේ අවසන් කාලයයි. එබැවින් ඔහුගේ පුරප්පාඩුවට සරිලන ආරම්භක පිතිකරුවකු සොයා ගත යුතුව තිබේ. ඇතැම් ක්‍රීඩා විචාරකයන් හමේ කියන්නේ අර්ජුන ඉණවර්ධන, සමන් ජයන්ත ආදීහු ඒ වෙනුවෙන් ආරේග කළ හැකි බවකි. එහෙත්, එය පෞද්ගලික වාසි තකා කරන පණ්ඩිත කියමන් බවට විවාදයක් නැත. අර්ජුන හෝ සමන් ජයන්ත දිගුකාලීන දක්ෂම රිද්මයක් පවත්වාගෙන ගොස් නැත. මෙහි දී තේරීම් කමිටුවේ අවධානය යොමු විය යුත්තේ යැයි අපට සිතෙන්නේ තවක ආරම්භක පිතිකරුවෙක් වන උපුල් තරංග කෙරෙහි ය. උපුල් තරංගයට මෙවර එක්දින තරගාවලියේ අවස්ථාවක් ලබා දී තිබේ. එය අගය කළ යුතු ය. එහෙත්, අවස්ථා කිපයක් ලබා දී දක්ෂම පෙන්වීමට ඉඩ දීමට තේරීම් කමිටුව කටයුතු නොකළහොත් ඔහු ද අකාලයේ විනාශ වී යන ක්‍රීඩා තරුවක් වීම වැලැක්විය නොහැකි වනු ඇත.

මාවන් අතපත්තු හොඳ නායකයකි. ඔහුට ද තව වසර දෙක තුනකට වඩා ක්‍රීඩා කළ හැකියයි සිතිය නොහැකි ය. එම ස්ථානයට පිතිකරුවකු සෙවීම කළ යුත්තේ ඒ ගෙයිනි. ඒ සඳහා ශාන්ත කලවිධිගොඩ හොඳ හෝරා ගැනීමක් යැයි අපට සිතේ. එහෙත්, ඔහුට දිගින් දිගට ම අවස්ථාව ලබා දීමට තේරීම් කමිටුව පියවර ගෙන නැත. මාවන් ටෙස්ට් තරග 10 කදී සිංදු 8 ක් ලබා ගද්දී ද තේරීම් කමිටුව ඔහුට අවස්ථාව දුන්නේ ය. එහි ප්‍රතිඵලය වූයේ සාර්ථක ක්‍රීඩකයකු මෙන් ම සාර්ථක නායකයකු ද බිහිවීම ය. එබැවින්, ඔහුගේ ආදේශකයන්ට ද එම තැන දිය යුතුම ය. මාවන්ගෙන් පසු ශ්‍රී ලංකා කණ්ඩායමේ නායකයා විය යුත්තේ කවුරුන් ද? එය ද ශ්‍රී ලංකා ක්‍රිකට් පිල හමුවේ ඇති බරපතල ප්‍රශ්නයකි. උප නායක මහේල දිගුකාලීන නායකයකුට උචිත යැයි සිතිය නොහැකි ය. වාස්, මුරලි වැන්නවුන්ට ද තව වසර 3, 4 වඩා ක්‍රීඩා කළ හැකැයි සිතිය නොහැකි ය. එබැවින්, ඔස්ට්‍රේලියාව මාත් ටේලර් යටතේ රිකී පොන්ටිං මතු කළා සේ මාවන් යටතේ නව නායකයකු බිහිකර ගත යුතු ය. ඒ සඳහා ඇති හොඳම හෝරාගැනීම විය යුත්තේ කුමාර් සංගක්කාර බව අපගේ විශ්වාසයයි. තවමත් ප්‍රතිභාදී පිලක් ඉතිහාසයේ දී ම දර්ශනය හැකි අන්දමේ පන්දු යවන්නන් අපට සිටි නමි ඒ දෙදෙනෙකු පමණි. මෙවර තරගාවලියේ දී ද හෙළිදරව් වූ ඒ සත්‍යයේ සංකේතයන් දෙක නම් මුරලි හා වාස් ය. මුරලිත් වාසුත් තවත් වසර දෙක තුනකට පමණ වර ම පිටියෙන් සමුගත හැකි ය. එහි දී ශ්‍රී ලංකා ක්‍රිකට් පිලේ පන්දු යැවීමේ ආශයට අත්වන ඉරණම කුමක් ද? ඔවුන්ට ආදේශ කළ හැකි ක්‍රීඩකයින් පෙනෙන තෙක්මනෝවත් සිටී ද? සජිව වීරකෝන්, ලසිත් මාලිංග, මාලිංග බණ්ඩාර වැනි පන්දු යවන්නන් නිසි මගට යොමු කරගත හොත් තවත් මුරලිලා වාස්ලා තැනීමට හැකිවනු ඇත. එහෙත්, තේරීම් කමිටුවට ක්‍රිකට් බලධාරීන්ට පුනුණුකැරවත්ත ඒ සඳහා වුවමනාවක් අති බවක් පෙනෙන්නට නැත. ඉහත සඳහන් කළ සියල්ල ම තව වසර දෙකතුනකින් ශ්‍රී ලංකා ක්‍රිකට් පිල හමුවේ මතුවිය හැකි බරපතල අභියෝගයන් ය. ඒවායේ සෙවනැලි දැන්ම දිස්වන්නට පටන් ගෙන තිබේ. එම සෙවනැලි දැක දකන් ක්‍රිකට් බලධාරීහු නිහඬව සිටී ම පුදුමයට කරුණකි. ඔවුන්ට පෙනෙන්නේ අද දක්වන දක්ෂම්ම පමණි. නෙට පමණ දක්ෂම දක්වය හැකිදැයි යන්න ගැන ඔවුහු අවධානය යොමු නොකරති. බටහිර ඉන්දීය කොදෙව්වන් සමග පැවැති තරගාවලියේ දී 2-0 ක් ලෙස ජය ගැනීම ක්‍රිකට් පරිපාලනයේ හොඳකමක්, අලුත් පුනුණුකරු ටොම් මූඩිගේ හොඳකමක් ලෙස ඇතැම්හු අර්ථකථනය කරති. එහෙත්, එය එසේ නොවන බව හොඳකාරව ම පැහැදිලි ය. තාවකාලික සිහින ලෝකවල ඇඳි සිටින්න කටයුතු කළහොත් කටක් නොදැනීම බිම ඇදවැටෙනු ඇත. එය වදක්වා ගැනීම සිය යු පාර්ශ්වවල යුතුකමකි. වගකීමකි. මෙම යුතුකම් වගකීම් හරිහැටි ඉටු නොකළ හොත් ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව අඳුරට තල්ලු වී යාම නොවැලැක්විය හැකිවනු ඇත.

6 වන පිටෙන්

කළේ ය. වීරෙක ගොළුඳඳවත, හිඩාහය, බඹරු ඇවිත්, අහස් ගව්ව චිත්‍රපටවලට සංගීතය හිරිමාණය කරමින් චිත්‍රපට සංගීතයේ විප්ලවයක් කළ ඔහු තවත් වීරෙක වෙදකාමීගේ, දඬුබස්න-මාමාය, ඇසලු කලුවර වැකි වෙලිනාට්‍යවලට සංගීතය හිරිමාණය කරමින් වෙලිනාට්‍ය සංගීතයේ විප්ලවයක් කළේ ය. කේමදාස සැමදා කිවේ සංගීතය වාදය ඕනෑවි පසේ ගීතය නොවන බවයි. ඔහු එය භාවිතයෙන් ඔප්පු කළේ ය. වරෙක කිසිදු වාදය භාණ්ඩයක් උපයෝගී කර නොගෙන මීගිරි හඬින් පමණක් කරුණාකයනය සංගීතයක් තනන්නට ඔහු සමත් විය.

අද වන විට රෝගීවත්, ඊයපත්වත් සිටින මේ අසහාය ගායන්ධරයා තවමත් හඳු පෙවෙනයේ පසුවන දඹකාර තරුණයකු වැනි ය. අදටත් ඔහු අතින් හිරිමාණය වන හිරිමාණ තුළ ඇතිව ජවය දුටුවිට ඒ තරුණ බව බැනවීන් පසක් වේ.

කවිදු කල්හාර

Indian Oil Cup

Date	Match	Venue
August		
1	Rest/Reserve Day	
2	Sri Lanka v West Indies	Dambulla(D/N)
3	Sri Lanka v India	Dambulla (D/N)
5	Rest/Reserve Day	
6	Sri Lanka v West Indies	R Premadasa(D/N)
7	India v West Indies	R Premadasa(D/N)
8	Rest/Reserve Day	
9	Final	R Premadasa(D/N)
10	Rest/Reserve Day	

තුන්වන සීනුව

ශ්‍රීනාත් මද්දුමගේ



ලෝකයේ වාසය කරන මනුෂ්‍යයන් අතර ඇති වන්නා වූ සතුටින් හෝ දුකින් යුක්ත වූ කිසියම් අවස්ථාවක් අනුකරණය කර දක්වීම නාට්‍යය යයි හරක මුනිවරයා පවසා ඇත. ග්‍රීසියේ විසූ ඇරිස්ටෝටල් පඬිවරයා පවසා ඇත්තේ නාට්‍යයක් යනු කිසියම් කාර්යයක් අනුකරණය කිරීමය කියා ය.

මෙම නිර්වචන දෙක දෙස බලන කල අපට එක් කරුණක් පැහැදිලි වේ. එනම් නාට්‍ය කලාවත් කතා කලාවත් අතර පවතින පැහැදිලි වෙනසයි.

කතා කලාව යනු යම්කිසි සිද්ධියක් හෝ කල්පිතයක් හෝ ඉතිහාස කතාවක් හෝ වචන මාර්ගයෙන් විස්තර කිරීමකි. නාට්‍ය කලාවේ එබඳු විස්තර කිරීමක් හෝ ව්‍යාත්‍යාවක් හෝ නැත. එහිදී සිදුවන්නේ සිද්ධියක් හෝ කල්පිතයක් හෝ ඉතිහාස කතාවක් ඇස් ඉදිරිපිට රඟ දක්වීමයි. එබැවි-

අනුකරණය හා සමාරෝපය

න් නාට්‍යයට දෘෂ්‍ය කාව්‍ය කියාත් රූප හෝ රූපක කියාත් ව්‍යවහාර කරනු ලැබෙයි. කථා කලාවට ශ්‍රව්‍ය කාව්‍ය කියනු ලබන්නේ ද ඇසිය යුතු කලාව යන අර්ථයෙනි.

යම්කිසි කතාවක් නාට්‍යයක් ලෙස ඉදිරිපිත කිරීමේදී එම කතාවට අවශ්‍ය චරිත වෙනුවෙන් වෙනත් පුද්ගලයන් පෙනී සිටීම සිදු වේ. මෙම පෙනී සිටීම වෙනුවෙන් වෙස් වලාගැනීමක් කළ යුතුය.කතාවක් නාට්‍යයක් බවට පෙරළෙන්නේ මෙම වෙස් වලාගැනීම හේතුවෙන් වන අතර මෙම වෙස් වලාගැනීම නාට්‍ය කලාවේ ඇති විශේෂ ලක්ෂණයයි. මෙය සාමාරෝපය යනුවෙන් ද හැඳින්වේ. යම් තැනක සාමාරෝපයක් ඇත් ද එතැන නාට්‍ය කලාවේ අංගයක් පහළ වී ඇතැයි මහාචාර්ය සරච්චන්ද්‍රයන් පවසා ඇත.

සාමාරෝපය යනු කුමක් ද?

සාමාරෝපය යනු ආවේශවීමක් වශයෙන් ද සැළකිය හැකිය. ආරූඪයක් හෝ ආරෝහය පිළිබඳව වැඩිදුර පැහැදිලි කිරීමක් අවශ්‍ය නොවේ. ඔස්ට්‍රේලියාවේ පිදිංචි වී සිටින අපට නිරන්තරයෙන්ම එක් දවසකට බොහෝ වාරයක් අපේ මව්බිම වෙත සිත ඇදී යන බව අමුතුවෙන් කිව යුතු නොවේ. අපේ මව් බිමේ තොවිල් පළක් මතකයට නඟා ගනහොත් එහි සිටින යකැදුරා මහා-සෝනා හෝ කලු යක්ෂා ලෙස ආවේශ වීම ඔබේ සිහියට නැඟෙනු ඇත. මහසෝනා ආරූඪ වීම යනු යකැදුරා මහාසෝනා ලෙස වෙස් වලාගෙන යකුන් අනුකරණය කිරීමයි. එබැවින් ඔහු කරන්නේන් කෙදිනක හෝ දැක නැති කල්පිතයක් අනුකරණය කිරීමයි.

යම් කිසි නාට්‍යයක් ගතහොත් එහි කවර හෝ පුද්ගලයෙක් රජතුමා ලෙස හෝ හිඟන්නෙකු ලෙස හෝ ආරූඪ වීමක් සිදු වෙයි.මෙම ආරූඪය හෝ ආවේශය අවශ්‍ය වන්නේ අනුකරණය හෙවත් රඟපෑම සඳහාය.

අන්කරණය ඔස්සේ කරන සමාරෝපය මනුෂ්‍යයා තුළ සහජයෙන්ම පිහිටි ලැදියා-වක් හා දක්ෂතාවයක් මත පදනම් වෙයි.

ළමයි බාල කාලයේ පටන්ම කිසිවකුගේ උපදෙස් නොලැබ දෙමුවුපියන් හෝ විඩිගිරියන් අනුකරණය කරමින් ක්‍රීඩා කරති. තොයෙක් මාදිලියේ ක්‍රියාවන්හි නිරත වෙති. මෙම අනුකරණයෙන් බාල ළමුන් මහත් ආස්වාදයක් හා තෘප්තියක් ලබන බව අඳුනගන්නේ කිව යුතු නොවේ. එය කුඩා දරුවාගේ රංගනයේ මූලික අවස්ථාවයි.

පසුගිය කලාපයේ අපි සතර අභිනය නාට්‍යයකට කෙතරම් වැදගත් වන්නේ ද යන්න සාකච්ඡා කළෙමු. සතර අභිනය සාර්ථක වන්නට නම් සමාරෝපය හෙවත් අනුකරණයද අවශ්‍ය වේ. ඔබට රංග ශිල්පියෙකු වන්නට අවශ්‍ය නම් ඔබද එදිනෙදා හමුවන චරිත අඳුනුකරණය කර බලන්න. එම චරිත වලට හුදුකලාව ආරූඪ වන්න. එය ඔබට සාර්ථක රංග ශිල්පියෙකු ශිල්පිණියක වීමට අඩි තාලමක් වනු ඇත